**ශීර්ෂය 263 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 අප්‍රේල් 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.5 (අ) | හානි හා පාඩු සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. | 3.5(අ), (ඈ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් කාණ්ඩවල ශේෂයන්ගේ එකතුව රු.20,751,725,957ක් වුවද, ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල අවසන් ශේෂය රු.5,761,155,640ක් වූයෙන් රු.14,990,570,317ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද SA 82 වාර්තාව දෝෂ සහිතව ඉදිරිපත් කළ බැවින් ඒ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී. නිවැරදි SA 82 වාර්තාව ලද විගස ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂ නිවැරදිව ඉදිරිපත්කළ යුතු අතර වෙනස්කම් පිළිබඳව හෙළිදරව් කළ යුතුය. |
| (ii) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන -SA 82 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද වියදම රු.53,582,845ක් වූ අතර, | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද SA 82 වාර්තාව දෝෂ සහිතව ඉදිරිපත් කළ බැවින් ඒ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී. නිවැරදි SA 82 වාර්තාව ලද විගස | වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වියදම් ප්‍රකාශය - ACA2(ii) ආකෘතිය අනුව රු.91,368,443 ක් වූයෙන් යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම් සහ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා දරන ලද වියදම් එකතුවෙහි රු.37,785,598ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | |
| (iii) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන SA 82 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂයේ ඉඩම්වල මුළු වටිනාකම රු.1,179,634,089ක් වුවද, උපලේඛනය අනුව රු.395,667,268ක් වූයෙන් රු.783,966,821 ක වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද SA 82 වාර්තාව දෝෂ සහිතව ඉදිරිපත් කළ බැවින් ඒ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී. නිවැරදි SA 82 වාර්තාව ලද විගස ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන - SA 82 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂයේදී වත්කම් විෂයයන් තුනක ආරම්භක ශේෂයන්ට ගැලපීම් කරන ලද එකතුව රු.27,813,137ක් හා වත්කම් විෂයයන් හතරක ඉවත් කිරීම් ලෙස දැක්වෙන එකතුව රු.78,345,349ක ශේෂ සනාථ කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම ශේෂ විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද SA 82 වාර්තාව දෝෂ සහිතව ඉදිරිපත් කළ බැවින් ඒ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී. නිවැරදි SA 82 වාර්තාව ලද විගස ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ශේෂ සනාථ කරගැනීමට අවශ්‍ය උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94(i) අනුව වාර්ෂික ඇස්තමේන්තුවෙහි මුදල් ප්‍රතිපාදන සලසා තිබුණොත් මිස කිසියම් දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ | 2022 වර්ෂයේ දෙසැම්බර් මස ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ අවසන් බිල්පත් සඳහා ප්‍රතිපාදන | මුදල් රෙගුලාසි 94(i) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා |

| | | |
|---|---|---|
| සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසියම් වියදමකට හෝ බැරකමකට හෝ මුදල් ගෙවීමේ පොරොන්දුවකට බැඳීම් ඇතිකර නොගත යුතුය. ඊට පටහැනිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැය විෂයයන් 03කට අදාළව ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා රු.9,021,580ක බැරකම් වලට එළඹ තිබුණි. | ප්‍රමාණවත් නොවූ බැවින් සහ 2023 වර්ෂයේදී ගෙවීමට අපේක්ෂා කළ බැවින් 2022 වර්ෂයේ බැරකම් වශයෙන් දක්වන ලදී. | බැරකම් සඳහා බැඳීම් ඇතිකර නොගත යුතුය. |

**2.2**

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 පෙබරවාරි 11 දිනැති අංක 19/0549/101/030 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට ණය සහන ලබාදීමේ වැඩසටහන යටතේ මාස 06ක සහන කාලයකින් ආපසු ගෙවීමට පාර්ශවයන් 10ක් වෙත ලබාදී තිබුණු රු.38,000,000ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.22,638,517 ක් හිඟව පැවතුණි. | 2023.03.31 දින වන විට මෙම හිඟයෙන් රු.913,590ක් අයකර ඇති අතර, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරමින් පවතී. | අප්‍රමාදව නියමිත කාලය තුළදී ණය ආපසු අයකර ගත යුතුය. |
| (ආ) | 2018 හා 2019 වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ග්‍රාම ශක්ති ජනතා සමිති බැංකු ගිණුම් 137ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,669,586ක ශේෂයක් නිශ්කාර්යව පැවතුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05ක ග්‍රාම ශක්ති ජනතා සමිති 10ක් විසින් චක්‍රීය ණය ක්‍රමය යටතේ ලබාදී තිබුණු රු.4,161,148ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,620,937ක ණය වාරික හා රු.280,881ක පොළිය සමඟ එකතුව රු.1,901,818ක මුදලක් අයවිය යුතුව පැවතුණි. | ග්‍රාම ශක්ති සමිති ප්‍රතිසංවිධාන කටයුතු සිදුකරමින් පවතින බවත්, සමිති අතර, අරමුදල් සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳව අමාත්‍යාංශයෙන් ලැබෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ. | බැංකු ගිණුම්වල ඇති මුදල් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ චක්‍රීය ණය සහ කාන්තා ගෘහ මූලික ණය වැඩසටහන යටතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ණය ලබාදී තිබුණු ණයලාභීන් 121දෙනෙකුගේ රු.594,700ක මුදලක් හා සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ණය ලබාදී තිබුණු ණයලාභීන් 11 දෙනෙකුගේ රු.59,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයවිය යුතුව පැවතුණි. | කොවිඩ් - 19 තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් ණය අයවීම් අඩුවී ඇති අතර, හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ණය මුදල් අප්‍රමාදව අයකර ගත යුතුය. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| **නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්,එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට ඒ අනුව කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| මුදල් රෙගුලාසි 137(5), 138(3),(5), (6) සහ 139(5) | 29,606,858 | 2022/2023 මහ කන්නයේ පරිසර හිතකාමී පොහොර සහනාධාර වැඩසටහන යටතේ පොහොර මිලදී ගැනීම සඳහා දරන ලද වියදම් සනාථ කෙරෙන ඉන්වොයිස්පත් හා ගබඩා ලැබීම් නිවේදන ගෙවීම් වවුචරය සමඟ අමුණා නොතිබුණි. | මුදල් රෙගුලාසි 137(5), 138(3),(5), (6) සහ 139(5) ට පටහැනිව කටයුතු කර නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම් කළ යුතුය. |

## 2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ජීප් රථයක 2022 ඔක්තෝබර් 06 විගණිත දිනට මයිලෝ මීටරයේ සඳහන් කිලෝමීටර් ගණනට වඩා කිලෝමීටර් 10,708 ක් ධාවන සටහන්වල ඇතුළත් කර ධාවනය නොකළ දුර වෙනුවෙන් | මයිලෝ මීටරය නිවැරදි කළ පසු පැවති අගයේ සිට ධාවන සටහන් යාවත්කාලීන කර ඇති බව දන්වමි. | ඉන්ධන නිකුත් කිරීම, ඒවා ධාවන සටහන් - වලට ඇතුළත් කිරීම හා ඉන්ධන තුලනය කිරීම නිවැරදිව සිදුකළ යුතුය. |

රු.179,447 ක් වූ ඉන්ධන ලීටර් 1427 ක් නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.6 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 215(3), භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 නොවැම්බර් 03 දිනැති අංක 06/2020 දරන භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශයේ 02 ඡේදය හා 2020 ඔක්තෝබර් 14 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 06 හි 2.4 ඡේදයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින රු.29,606,858ක වටිනාකමට චෙක්පත් 02ක් ලියා ආදායකයින් වෙත භාර නොදී, අත රඳවාගෙන, එම චෙක්පත් දෙකෙහි ආදායකයා " දිස්ත්‍රික් ලේකම් " ලෙස යලි සංශෝධනය කර, 2023 පෙබරවාරි මස දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය නිල බැංකු ගිණුමට තැන්පත් කර, පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණි. | ඉදිරිපත් වූ වවුචර්වල අඩුපාඩු පැවති බැවින් අඩුපාඩු සකස්කර එවන ලෙස වවුචර්පත් දිස්ත්‍රික් පොහොර ලේකම් කාර්යාලයට භාරදුන් අතර පොහොර නිකුත් කිරීමට අදාළ මාර්ගෝපදේශ නියමයන්ට අනුකූල නොවන අවස්ථා අනාවරණයවූ බැවින් එම චෙක්පත් අවලංගුකර පොදු තැන්පත් ගිණුමේ තාවකාලිකව රඳවා ගෙන අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් පසු 2023 පෙබරවාරි මස මුදල් ගෙවන ලදී. | මුදල් රෙගුලාසි 215(3) ප්‍රකාරව හා චක්‍රලේඛ උපදෙස් අනුව, ආසන්න ගෙවීම සඳහා ප්‍රතිපාදන රඳවා නොගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අම්බලන්තොට ප්‍රාදේශීය | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඕකිඩ් හා ඇන්තූරියම් මල් වගා ව්‍යාපෘති සඳහා පොහොර | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාලය විසින් ඕකිඩ් හා ඇන්තූරියම් මල් වගා ව්‍යාපෘති සඳහා රු.4,235,417ක් ද, උම්බලකඩ හා කරවල නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.4,298,220ක් ද, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විසිතුරු මත්ස්‍ය අභිජනනය හා වගා කිරීමේ ව්‍යාපෘති සඳහා රු.2,704,350ක්ද වැයකර තිබුණි. ව්‍යාපෘති තුළින් අපේක්ෂා කර තිබුණු සෘජු හා වක්‍ර රැකියා අවස්ථාවන් බිහි කිරීම, නිෂ්පාදන පිරිවැය අවම කිරීම යන අරමුණු ඉටුවී නොමැති බවත්, නිෂ්පාදකයන්ට ස්ථිර වෙළඳපලක් හා මිලක් ලැබීම, දිළිදු බවින් තොරවීම, ප්‍රතිලාභී පවුල්වලට යහපත් ජීවන තත්ත්වයක් ලැබීම යන ප්‍රතිලාභ අත්කරගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | සපයා ගැනීමේ අපහසුතා හා රට තුළ පැවති දැඩි ආර්ථික හා මූල්‍ය අර්බුදය, මාළු හා තෙල් මිල ඉහළ යාම, සෘජුව බලපා ඇති බව දන්වා සිටිමි. සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආර්ථික අපහසුතා නිසා වරින් වර ව්‍යාපෘතිවලින් සාමාජිකයින් ඉවත්වීම හා රට තුළ පැවති දැඩි ආර්ථික හා මූල්‍ය අර්බුදය හේතුවෙන් මේ වනවිට අක්‍රිය මට්ටමේ ඇති බව දන්වා ඇත. | යුතු අතර, අරමුණු ඉටුකර ගත යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන මගින් බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වටු පාලන ව්‍යාපෘතිය සඳහා රු.1,630,581ක් ද වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කුකුළු පාලන ව්‍යාපෘතිය සඳහා රු.7,309,635ක්ද වැයකර තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ මාස 07ක කාලය තුළ ප්‍රතිලාභීන් වෙත ලබාදුන් වටු කිරිල්ලියන්ගෙන් සියයට 3.5ක් පමණ හා කුකුළු පැටව් මිලදී ගෙන මාස 10ක කාලයක් තුල සියයට 18ක් පමණ ප්‍රතිශතයක් ඉතිරි වී ඇති අතර, ව්‍යාපෘතීන් අසාර්ථක වී තිබුණි. | වටු කුරුල්ලන් සඳහා වෛරසයක් නොවැළදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේ නම් ව්‍යාපෘතිය සාර්ථක වනු ඇත. සත්ත්ව ආහාර හා බෙහෙත් වර්ගවල මිල සීඝ්‍රයෙන් ඉහලයාම නිසාත්, බෙහෙත් වර්ග සොයා ගැනීමට නොහැකිවීම නිසාත් කුකුළු පැටව් මිය ගොස් ඇති බව දන්වා ඇත. | ව්‍යාපෘති අනුමත කළ ආකාරයට හා අපේක්ෂිත අරමුණු ළඟා කර ගත හැකි ආකාරයට ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබුණු රු.984,692ක් වූ උපකරණ වසරකට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | බිම්මල් ආශ්‍රිත නිෂ්පාදනවලට අදාළව රටේ පැවති ආර්ථික අර්බුදය හා නිෂ්පාදන පිරිවැය ඉහළ යාමෙන් අලෙවි කිරීමේ අපහසුතා නිසා නිෂ්පාදනය නවතා දමා ඇත. | බෙදාදුන් ද්‍රව්‍ය හා උපකරණ අදාළ අරමුණු සඳහා යොදා ගත යුතුය. |

## 3.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන මඟින් යටිතල පහසුකම් සංවර්ධනය යටතේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අන්දරවැව ධර්මදූත ජල ව්‍යාපෘතියේ වැව අසල පොම්පාගාරයේ සිට උස්ගල ජල ටැංකි පද්ධතිය දක්වා නව ජලනල එළීම වෙනුවෙන් ජලනල ලබාදීම සඳහා රු.1,950,798 ක් වැය කර තිබුණි. ගෙවීම් වාර්තාවේ වැඩ විෂයය අංක 02 යටතේ දැක්වෙන පීවීසී බට සපයා එළීම වෙනුවෙන් මීටර් 96 ක් සඳහා ඇස්තමේන්තුකළ පී.වී.සී. පීඑන්ටී 11 වර්ගයේ ජලනල වෙනුවට 7 වර්ගයේ බට යොදා ගැනීම හේතුවෙන් රු.114,897ක් වැඩිපුර ගෙවා තිබුණි. | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව වැඩිපුර ගෙවීමක් සිදුව නොමැති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 156(i) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2022 යටතේ මැටි ගඩොල් කර්මාන්තයේ නියුතු වූවන් 16 දෙනෙකුට රු.389,000ක් වූ වටිනා ටකරන් සහ ගඩොල් කර්මාන්තයේ නියුතු අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් 50 දෙනෙකු වෙත රු.970,000ක් වටිනා ටකරන් ලබාදී තිබුණු අතර, ඉන් ප්‍රතිලාභීන් 18 දෙනෙකු වෙත ලබාදී තිබුණු ටකරන්, මඩු සැකසීම සඳහා යොදාගෙන නොතිබුණි. | වැඩ නිමකරන ලෙසත් එසේ නොකරන ප්‍රතිලාභීන්ගේ ප්‍රතිලාභ නැවත අයකරන ලෙසත් දැනුවත්කර ඇත. | අරමුදල් ඵලදායීව ප්‍රයෝජනයට ගත යුතු අතර, ව්‍යාපෘති තුලින් අපේක්ෂිත අරමුණු ඉටු කරගත යුතුය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය අනුව රු.500,000ක් ඉක්මවන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් | ඉදිරියේදී විධිමත් ගිවිසුමක් අත්සන් කර භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කරමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය අනුව ගිවිසුම් වලට එළඹිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාලය විසින් රු.9,859,653ක් වූ භාණ්ඩ මිලදී ගැනීමේදී ගිවිසුමකට එළඹ නොතිබුණි. | | |
| (ආ) | අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඔකිඩ් වගාව ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.8,486,250ක ප්‍රතිපාදන අනුමත වී තිබුණද, ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීම නිසා රු.2,635,000ක් වටිනා පැළ මිලදී ගැනීමට නොහැකි වී තිබුණි. එම නිසා ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද රු.6,052,762ක් වූ අනෙකුත් වියදම් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | 2021 ජූලි 12 දින ඔකිඩ් පැළ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඔක්තෝබර් 11 දින ඇණවුම් කළද, පැළ මිලදී ගැනීමට නොහැකි වූ බව දන්වා සිටිමි. | ව්‍යාපෘති අනුමත කර ඇති ආකාරයට හා අපේක්ෂිත අරමුණු ළඟා කර ගත හැකි ආකාරයට ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන මාරුවී යාමේදී ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භාරදිය යුතු වුවත්, එසේ භාර නොදී, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටැබ් පරිගණක යන්ත්‍ර තුනක්, ප්‍රාදේශීය ලේකම්වරයකු හා ගණකාධිකාරීවරු දෙදෙනෙකුද ඩිජිටල් කැමරාවක් සහ මෙමරි කාඩ්පතක්, වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරියකුද රැගෙන ගොස්, වර්ෂ 01 – 04ත් අතර කාලයක් ඉක්මවා ඇති නමුත් එම වත්කම් නැවත ලබාගෙන නොතිබුණි. | නැවත භාරදෙන ලෙස 2023 ජනවාරි මාසයේදී දැනුම් දී ඇත. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානියක් සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරාසය තුළ අවස්ථා 05කදී සිදුව තිබුණ රු.123,187ක් වූ අනතුරු හා හානි සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2023 මාර්තු 14 දින වන විටත් පූර්ණ වාර්තා ලබාදී නොතිබුණි. | නැවත තොරතුරු පරීක්ෂාකර ඉදිරිපත් කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වර්ෂ 10කට අධික කාලයකදී අවස්ථා 02ක සිදුවී තිබුණු එකතුව රු.248,245ක් වූ වාහන අනතුරු 02ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) අනුව කටයුතු කර නොතිබුණි. | නැවත තොරතුරු පරීක්ෂා කර ඉදිරිපත් කරන බව දන්වමි. | හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ඔක්තෝබර් 10 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයකට සිදුවූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව පරීක්ෂණ පවත්වා නොතිබුණි. | නැවත තොරතුරු පරීක්ෂා කර ඉදිරිපත් කරන බව දන්වමි. | අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2013 ජුලි 31 දින ජීප් රථයකට සහ 2015 ඔක්තෝබර් 12 දින කැබ් රථයකට සිදුව තිබුණු අනතුරු සම්බන්ධයෙන් පිළිවෙලින් රු.56,747ක් සහ රු.12,750ක් විෂය ලිපිකරුගෙන් අයකර ගැනීමට ලබාදී තිබුණු නිර්දේශය සහ 2018 ජනවාරි 08 දින වාහනයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් අවසන් වාර්තාව මගින් ලබාදී තිබුණු නිර්දේශය 2023 මාර්තු 14 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ විෂය ලිපිකරු විසින් 2021.10.28 දින ඉදිරිපත්කල අභියාචනය සම්බන්ධව කරුණු සලකා බලමින් සිටින බවත් 2018.01.08 දින වූ අනතුර සම්බන්ධයෙන් රක්ෂණයෙන් ආවරණය නොවූ අලාභය අදාළ නිලධාරීන්ගෙන් අයකරගන්නා බවත් දන්වා ඇත. | අවසන් වාර්තා මගින් ලබාදී තිබුණු නිර්දේශ අනුව අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10කින් විශ්‍රාමිකයින් 31 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු.3,912,834ක විශ්‍රාම වැටුප් අයවිය යුතුව පැවතුණි. | විශ්‍රාමිකයින් සම්බන්ධව ඉදිරිකටයුතු කරමින් පවතින බව දන්වමි. | වැඩිපුර ගෙවීම් අප්‍රමාදව අයකර ගත යුතුය. |

## 4. යහපාලනය

**මහජනයා වෙත සේවා ඉටු කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ සිට නිකුත් කර තිබුණු දීමනා පත්‍ර 40ක් හා බලපත්‍ර 57 ක් 2023 ජනවාරි 18 දින වන විටත් අදාළ දීමනාපත්‍ර / බලපත්‍ර ලාභීන් වෙත භාර නොදී කාර්යාලයේ රඳවාගෙන තිබුණි. | දීමනාපත්‍ර හා බලපත්‍ර කඩිනමින් ලබාදීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | දීමනාපත්‍ර අප්‍රමාදව බෙදාදීමට කටයුතු කළයුතුය. |